# අලුත් භාෂාවක් ඉගෙනගන්න උදව් වෙන යෝජනා

## 1 ඉගෙනගන්නේ ඇයි කියලා හිතන්න

*"ඔයා අලුත් භාෂාවක් ඉගෙනගන්න පටන්ගත්තේ ඇයි කියලා හොඳට හිතන්න. ඒ හේතු කොළේක ලියන්න. භාෂාව ඉගෙනගන්න එක නතර කරන්න හිතෙන වෙලාවට ඒ කොළේ බලන්න."—සෙරීනා.*

මොන භාෂාවද ඉගෙනගන්න ආස?

ඒ භාෂාව තෝරගත්තේ ඇයි?

භාෂාව:


ඒ භාෂාව තෝරගන්න හේතු:



## 2 උදව් කරන්න පුළුවන් අයව හොයාගන්න

*"මම ස්පාඤ්ඤ භාෂාව ඉගෙනගත්ත කාලේ මං වගේ ඒ භාෂාව ඉගෙනගත්ත යාළුවෝ කිහිපදෙනෙක් මට හිටියා. එන අභියෝග ගැන, ඒවා ජයගන්නේ කොහොමද කියන එක ගැන අපි කතා කළා."—හෙලේනා.*


භාෂාවක් ඉගෙනගද්දී අභියෝගවලට මුහුණ දෙන්න වුණොත් ඒවායින් ගොඩ එන්න උදව් කරන්න පුළුවන් අයගේ නම් ලියන්න.



"භාෂාවක් හරියට සාගරයක් වගේ. ඒ සාගරයේ සම්පූර්ණයෙන්ම ගිලෙන්නේ නැතුව භාෂාවක් හොඳට කතා කරන්න ඉගෙනගන්න බැහැ."
—ක්‍රිස්ටොෆර්.

| වෙනි පිටුව

www.jw.org © 2016 Watch Tower Bible and Tract Society of Pennsylvania



# 3 කළකිරෙන්න එපා

*"දැන් නම් භාෂාව හොඳට දන්නවා කියලා හිතුවත් ඊළඟ මොහොතේ වෙන දෙයක් නිසා ඔයා කළකිරෙන්න පුළුවන්."*
*—විවියන්.*

ලොකු ලොකු ඉලක්ක තියාගන්න ගිහින් කළකිරෙන්න එපා. ඔයාට ළඟා වෙන්න ලේසි පොඩි පොඩි ඉලක්ක තියාගන්න. ඒවා මොනවාද?

**"සමහරවිට ඔයාට වෙන අය තරම්ම ඉක්මනට භාෂාව අල්ලගන්න බැරි වෙයි. ඒත් එහෙම වුණා කියලා ඒ ගැන දුක් වෙන්න එපා."—තෝමස්.**

# 4 හැමදාම පුරුදු වෙන්න

*"ඔයා වෙන මහන්සියේ තරමටම තමයි ඔයාට ප්‍රතිඵල ලැබෙන්නේ. හැමදාම භාෂාව ඉගෙනගන්න කාලය වෙන් කරොත් ඒක ඉක්මනට ඉගෙනගන්න පුළුවන්. එහෙම කරේ නැත්නං ඉතිං ප්‍රතිඵලය හිතාගන්න පුළුවන්නේ."—ඩැනියෙල්.*

අලුත් භාෂාවක් ඉගෙනගන්න ඔයාට සතියේ එක් එක් දවස්වලදී කොච්චර කාලයක් දෙන්න පුළුවන්ද කියලා ලියන්න.

| සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා | සෙනසුරාදා | ඉරිදා |
|---|---|---|---|---|---|---|
| | | | | | | |


www.jw.org © 2016 Watch Tower Bible and Tract Society of Pennsylvania

# 5 සංස්කෘතියට හුරු වෙන්න

*"භාෂාව විතරක් ඉගෙනගෙන මදි. ඒ භාෂාව කතා කරන අය කොයි වගේද, එයාලා වැඩ කරන්නේ කොයි විදිහටද කියලා හොයලා බලන්න ඕනේ. ඒ වගේම එයාලා කන කෑම, අහන සින්දු රස විඳින්න ඕනේ."—ඇලෙක්සිස්.*

ඔයා ඉගෙනගන්න භාෂාව කතා කරන අයගේ සංස්කෘතියට හැඩගැහෙන්න මොන වගේ දේවල් කරන්න පුළුවන්ද?

# 6 ඉගෙනගන්න භාෂාව කතා කරන රටට යන්න

*"අපි චිලී රටට ගිහින් මාස අටක් නැවතිලා හිටියා. ඒ නිසා අපිට ස්පාඤ්ඤ භාෂාව ඉක්මනට අල්ලගන්න පුළුවන් වුණා. මොකද කොයි වෙලෙත් ඇහෙන්නේ ඒ භාෂාව."—නටාෂා.*

ඔයා යන්න කැමති රට තියෙන තැන ලකුණු කරන්න.



වෙන රටකට යන්න බැරි වුණත් ඔයා ඉගෙනගන්න භාෂාව කතා කරන අය ඉන්න නගර, ගම් මොනවාද කියලා හොයලා බලන්න. ඔයාට එහෙට යන්න පුළුවන්ද?

"ඔයාට භාෂාවක් හොඳට ඉගෙනගන්න ඕනෙ නම් ඒ භාෂාව කියවන එක, කතා කරන එක, ලියන එක වගේම ඒ භාෂාව කතා කරනවා අහන් ඉන්න එකත් හරිම වැදගත්."—ඇලිසන්.



www.jw.org © 2016 Watch Tower Bible and Tract Society of Pennsylvania